**ඔබත් එල්ලුම් ගහ ඉල්ලන බෞද්ධයෙක් ද?**

ලෝකයේ කොතැනක හෝ යම් සිදුවීමක් වූ විට ඒ අරභයා යම් යම් උද්වේගකර සිතිවිලි සිත් සතන් තුළ පුබුදුවීම කවදත් සිදුවන්නකි. නිතරම ආවේගයට ම ඇදෙන මේ සිතෙහි ක්‍රියාකාරිත්වය නො හඳුනන්නවුන් **පහන් දැල්ලට ඇදෙන මෙරු මෙන්** ඒ ආවේගය නමැති ගින්නට ඇදී පිච්චී යති. එසේ පිච්චීම ම සැපයක් යැයි හඟිති. එය සමාජ සාධාරණය, යුක්තිය, සමානාත්මතාවය, මානව හිමිකම යනාදී නොයෙකුත් සරුව පිත්තල නම්වලින් සරසා ගෙන ඒ උදෙසා සටන් කොට බොහෝ දේ නසාගෙන සසර ම වඩවා ගනිති.

තථාගතයන් වහන්සේ සාරාසංඛෙය්‍ය කල්ප ලක්ෂයක් පුරා අනන්ත දුක් ගෙන අවබෝධ කොට වදාළා වූ නිවන් මග පසෙක ලා, ඉන් මෙපිට ඇති සුළු සුළු කාරණා ලොකු කොට ගෙන, ඒ මත්තේ ම තමන්ගේ වල කපා ගනිති. එසේ කොට **ලොකු දෙයක් කෙළෙමි** යි උදම් අනති.

රටේ අපරාධ අවම කිරීමට එල්ලුම් ගස ක්‍රියාත්මක කරන්නැයි බලකිරීම මේ දිනවල පවතින **නවතම විලාසිතාවයි.** තවත් අයෙක් කරනවා දැක අප ද ඒ පස්සේ නො ගොස්, මේ පිළිබඳව කෙටි හෝ විශ්ලේෂණයක් කිරීම තුලින් එම ඉල්ලීම් වල පවතින සාධාරණත්වය හොඳින් සලකා බැලීම බෞද්ධ අබෞද්ධ අප කාටත් වටනේ ය.

යම් කිසි අපරාධයක් වූ විට අප ගේ පිළිකුල මුලින් ම යොමු වන්නේ එම අපරාධය කළ තැනැත්තා වෙතටයි. **ඒ තැනැත්තා සමාජයෙන් තුරන් කළ යුතුය, අපරාධ අඩු කළ හැක්කේ එවැන්නවුන් සමාජයෙන් දුරින් ම දුරු කිරීමෙන් ය** යන හැඟීමක් අප තුළ පවතී. සමාජයෙන් තුරන් කරනවා පමණක් නොව මේ දිනවල පවතින ඉල්ලීම වන්නේ **ඔවුන් ජීවිතයෙන් ද තොර කරන ලෙසයි.** මේ ඉල්ලීම කොතෙක් දුරට සාධාරණ ද?

අපරාධයක බෞද්ධ විග්‍රහය (අපට හැඟෙන අයුරින්) වනුයේ එය සිතක ඇතිවන ලෝභ ද්වේෂ මෝහ මූලිකව ඇතිවුනු සිතිවිල්ලක් බලාත්මක වීමකි. සිත තුල අකුශලයට ඇති කැමැත්ත ක්‍රම ක්‍රමයෙන් වර්ධනය වීමේ ප්‍රමාණය වැඩි වත් වත් ම එයින් තමාට මෙන් ම සමාජයට ද වන හාණිය ද වැඩි වේ.

**අනිත්‍යය** ගැන මහා ඉහලින් කථා කරන බෞද්ධ අප මේ සිතක ඇතිවන සිතිවිල්ල අනිත්‍ය එකක් යැයි සිතුවාද? අද **අපරාධයකට** පෙළඹුනු සිත ම හෙට **මහා පුණ්‍යකර්මයකට** පෙරළෙන්නට ඉඩක් නැතිද? තත්පරයකට ලක්ෂයෙන් පංගුවකටත් වඩා අඩු කාලයක් පවතින සිතිවිල්ලක අනිත්‍ය වීමේ, වෙනස් වීමේ වේගය අනුව සලකා බැලූ විට අද පවතින සිත හෙටත් පවතී යැයි කෙසේ නම් සිතන්නට ද? අද සිල්වතා හෙට ස්ත්‍රී දූෂකයෙක් විය නො හැකිද? ඉතා විචිත්‍ර ව ධර්මය දේශනා කරමින් සිටි මහා ධර්ම කථිකයන් වහන්සේලා කී නමක් නම් මේ වනවිට සිවුරු හැර දමා නැවත කාමය සොයා ගොස් ඇතිද? එසේ නම් වරද ඇත්තේ කොහේද?

වරද ඇත්තේ පුද්ගලයා තුළ නොව ක්ලේශය තුලයි. නිවැරදි විය යුත්තේ ක්ලේශයෙන් පිරුණු සිත යි.

එදා බුදුන් වහන්සේ ධරමාන කාලයේ දී එක් ඇඟිල්ලක් ලබා ගැනීමට මිනිසුන් ගේ ජීවිතය තොර කරමින්, දහසකට වැඩි ජීවිත ගණනක් විනාශ කළ අහිංසක නම් තරුණයා (අද කාලයේ වචනයෙන් නම් **අපරාධකාරයා**) ගැන කණ වැකුණු සැනින් භාග්‍යවතුන් වහන්සේ කටයුතු කෙළේ කෙසේද? උන් වහන්සේ කොසොල් රජු වෙත, උදේනි රජු වෙත, හෝ බිම්බිසාර රජු වෙත දුවගොස් **මේ අපරාධකාරයා එල්ලුම් ගස් නො යවන්නේ මන්දැ** යි විමසුවේද? නැත. උන්වහන්සේ කළේ කෙළෙසුන් ගෙන් පීඩිත වූ සන්තානය තුළ නිකෙළෙස් සිතිවිලි ජනිත කරගන්නට උපකාර කිරීම ය. එසේ නො වන්නට **අංගුලිමාල රහතන් වහන්සේ** යන නම ශාසන ඉතිහාසයෙන් මැකී යන්නට ඉඩ තිබුනි.

නිගණ්ඨනාථපුත්තයන් ඇතුළු අන්‍ය තීර්ථකයන් හට බුදුපියාණන් වහන්සේ කිසිදා දොස් පවරා නැත. **නිගණ්ඨනාථපුත්තයා පහත් එකෙකැ** යි හෝ **අසවලා පහත් එකෙකැ** යි කිසිදා දොස් නගා නැත. උන්වහන්සේ දොස් පැවරුවේ ඒ චිත්ත සන්තානයන් හි පැන නඟින්නා වූ පහත් අකුශල ධර්මයන්ට ය. පුද්ගලයන්ට නොවේ. පුද්ගලයා යනු සිත නොවේ, සිත යනු පුද්ගලයා නොවේ. අනාත්ම සංකල්පය හදාරන අපට අමතක වී ඇත්තේ එයයි.

කුමක්ද? මේ සිත අපේ වසඟයේ නො පවතී. එය හේතු සකස් වූ කළ ඒ අනුව ඵලය උදාකර දේ. කුශලයට හේතු සකස් වූ විට කුශලය ද, අකුශලයට හේතු සකස් වූ කළ අකුශලය ද ජනිත කරවන මේ සිත අපට ඕනෑ වෙලාවට කුශලය හෝ අපට ඕනෑ වෙලාවට අකුශලය ඉපදවීමට අසමත් ය. මේ සිත කුශලයට වැඩිය යුත්තේ එහෙයිනි.

මින් අදහස් කරන්නේ අපරාධයන්ට අනුබල දීමක් ද? අපරාධකරුවන්ට නිදැල්ලේ ඉන්නට ඉඩ දීමක් ද? නැත. අපරාධ කළවුන්ට නීතියෙන් දඬුවම් කළ යුත්තේ ඔවුන් ගේ සිත සකස් කිරීමටයි. අසංවර ව ධර්මයට නො නැමෙන සිත නීතියෙන් හෝ නම්මා ගැනීම කළ යුත්තකි. එවන් සිතක් පසු කලෙක වරද නිවරද තමා තුළින් ම වටහා ගෙන නිවැරදි වනු ඇත.

එසේ නිවැරදි වන්නට ඉඩක් වත් නො තබා **මේකා මරා දමමු, මේකා මෙලොවින් තුරන් කළොත් අපට සැනසීමෙන් නින්ද යාවි** යි කියන්නා බෞද්ධයෙක් ද? **මේක කරපු එවුන්ට නම් හොඳක් වන්නේ නැත** යැයි සිතමින් දැවෙන පිච්චෙන ඔය සිත කරන්නේ **කැලේ ඉන්න සර්පයින් රෙද්ද අස්සේ දමාගෙන කනවෝ කනවෝ** යැයි කීමක් නොවේද? අනුන්ගේ අකුශලය දැක දැක තමනුත් අකුශල් කරගන්නා තැනැත්තා බෞද්ධයෙක් යැයි හඳුන්වා ගන්නට විළිබිය තිබේද? මේවා කර කර පෝය දිනට පන්සල් ගොස් **සියළු සත්ත්වයෝ නිදුක් වෙත්වා** කියමින්, **අපි නම් Vegetarian**, **අපි උම්බලකඩ වත් කන්නේ නැතැයි** කියමින් ලේබල් අලවාගෙන ඇති වැඩක් තිබේද?

අපරාධයන් වැළැක්වීම නීතියට පමණක් තනිව කළ හැකිද? නැත. ඒ සඳහා අප එකිනෙකා හට ද මහත් වූ කාර්යභාරයක් පැවරී ඇත.

කාන්තාවන් ගේ ඇඳුම් විලාසිතා දෙස මොහොතක් සිත යොමුකර බලන්න. නවීණ මාදිළියේ යැයි කියැවෙන ඇඳුම් මෝස්තර වල එකක වත් ශරීරයේ ලැජ්ජා තැන් නිවැරදිව වසාගෙන තිබේද? **එහෙන් පලපු, මෙහෙන් ඉරපු, බොහෝ විට යට ඇඳුම් පවා පිටට ප්‍රදර්ශණය කරමින්** මහත් උජාරුවෙන් යන්නා වූ, **ඌරාට අශූචිය අග්‍ර වූවා සේ ම බලු කුණක් වන් මේ ශරීරය** මහා වර්ණවත් එකකැයි මහත් වූ උද්දාමයෙන් අනෙකාට ප්‍රදර්ශණය කර පෘථග්ජන සිත් සතන් තුල කාම කෝපයන් උද්දීපණය කරන්නා වූ යුගයක් බිහිවීම මහත් වූ ඛේදවාචකයකි. අකුශලයට ම නැවෙන මේ සිත නො සෙල්වෙන සිතක් බවට පත්කර ගන්නා තෙක් මේවායින් සෙළවීමට ඇති ඉඩකඩ බොහෝ ය. එසේ නම් තමා ගේ ඇඳුමින් අනෙකා ගේ සිත් තුළ කාමයන් වර්ධනය කරමින් **මේකා කාම අපරාධකාරයෙක් ය, මේකා මගේ දිහා ඕනෑ නැති විදිහට බැලුවා ය, මගේ ශරීරය ස්පර්ශ කළා ය** යි අනෙකාට පමණක් දොස් පැවරීම කොතරම් දුරට යුක්ති සහගතද? එවන් දසුන් තුලින් ම කාමයන් වර්ධනය කරගන්නා පෘථග්ජනයා ගේ කාම ගින්න ඒ මොහොතට එසේ විරාමයක් තැබුවත් වෙනත් මොහොතක, වෙනත් දිනයක, වෙනත් ආකාරයකට සමාජයට ම මහත් වූ අඳුරු මතකයන් ඉතිරි කර මුදා හැරියහොත්, ඒ අවසන් ප්‍රතිඵලය දෙස පමණක් බලා සියල්ල විනිශ්චය කළ හැකිද?

වර්තමාන සමාජයේ බෞද්ධයැයි කියාගන්නා ඇත්තන් විසින් මුස්ලිම් කතුන් ගේ සම්පූර්ණ ශරීරය ඉතාමත් ම මනාකොට වැසුනු ඇඳුමට නින්දා කරති. උසුළු විසුළු කරති. එය **අල ගෝනියක් වැනිය** යි කියති. ඒ අප තුළ ඇති **බෞද්ධ** නම් වූ මාන්නයයි. **අප කළොත් ඕනෑ දෙයක් හොඳ ය, අන්‍ය ආගමිකයෙක් කළොත් ඕනෑ දෙයක් නරකය** යි සිතන්නට වර්තමාන ශ්‍රී ලාංකික (ලේබල්) බෞද්ධයා පුරුදු වී සිටිති. එහෙත් ඒ කාන්තාවන් ගේ ඇඳුම තුළ ශරීරයේ ලැජ්ජා තැන් මොනවට වැසී, කාම කෝපයන් නො ඇවිස්සෙන අයුරින් සකස් කරගත්, ප්‍රශංසනීය වූ ඇඳුමකි.

අද වන විට තාක්ෂණය ගැන මහා ඉහලින් කථා කරන අප අමතක නො කළ යුතු දෙයක් නම් මේ සියළු තාක්ෂණයන් උපකාර වී ඇත්තේ කෙලෙස් **වැඩිකිරීමට** මිස කෙලෙස් **අඩුකිරීමට නො වන** බවයි. අතීතයේ මෙන් නොව කාමාග්නිය වර්ධනය කර ගැනීමට (කාමය පමණක් නොව සියළු ක්ලේශයන්) ලෝකයේ ඇති ඕනෑම කාම වස්තුවක් මොහොතින් දෝතට ලබා දෙන මේ තාක්ෂණික දියුණුව සත්ත්වයින් ගේ ආධ්‍යාත්මික දියුණුව ක්‍රමයෙන් පිරිහීමට ලක් කරමින්, මිනිසා නො මිනිසා කරන්නට මේ වනවිට බොහෝ දායකත්වයක් ලබා දී ඇත.

අප මෙහි ලා සඳහන් කරන්නට යෙදුනේ සාකච්ඡාවට බඳුන් කළයුතු බොහෝ කාරණාවන් ගෙන් එකක් දෙකක් පමණි. එසේ කළේ ද ඔබ ගේ චිත්ත සන්තානයන් තුළ අවදිමත් බවක් ඇතිකොට, සිදුවන සිදුවීම් වලදී ධර්මය එයට ගලපා ගැනීමට සහ අනෙකාට පමණක් ඇඟිල්ල දිගුකොට තමා නිදොස් වීමට ම කටයුතු නො කොට **අපටත් කොහේ හෝ වැරදී ඇත** යන්න සිතා තමන්ගේ අඩුපාඩු ද සකසා ගෙන ලැබුවා වූ ජීවිතය ඉතාමත් ම අවිහිංසාවාදී ව ජීවත් වන්නට අවශ්‍ය කරන්නා වූ විමසිලිමත් ප්‍රඥාව ඔබ තුල අවදි කරවීමට මිස **මෙසේ කරන්නට ය, මෙසේ නො කරන්නට ය** යි උපදෙස් දීමට නොවේ.

අපට තිබෙන අකුසල් මදිවාට **අනුන්ගේ වැරදිත් තමන්ගේ මල්ලේ ඔබාගෙන** ඒ තුලිනුත් අකුසල් ම වැඩිදියුණු කරගන්නවා වෙනුවට, සිදුවන සියළු සිදුවීම් නුවණින් දැක සියළු සත්ත්වයෝ දහම තුලින් ජීවිතය දකිමින්, ජීවිතය තුලින් දහම දකින්නට කටයුතු කරත්වා.

මෙයට

ශාසනස්ප්‍රීතිකාමී - බණමඩුව